පසුගිය ජනවාරි 28 දින ඔස්ට්‍රේලියාවේ හංටින්ග්ඩේල් හි සිදුවූ ඝාතන-දිවි තොර කරගැනීමේ සිදුවීමක් සම්බන්ධයෙන් වාර්තා කිරීමේදී, මාධ්‍ය මගින් ඊට අදාළ ශ්‍රී ලාංකිකයාගේ බිරිඳ "සුදු හම සහිත කාන්තාවක්" ලෙසින් හඳුන්වා දී තිබීමත්, එසේම, එම කාන්තාව "රූමත් තරුණියක්" යැයි දක්වා තිබීමත් නිරීක්ෂණය කළ හැකි විණි. (අරුණ, දිවයින ජනවාරි 31, 2022)

ඔබ සිතන ආකාරයට,

1) "සුදු සම සහිත කාන්තාවක්" යනුවෙන් දරුවන්ගේ මව පිළිබඳව සඳහන් කිරීම පුවතට අදාළ වන්නේ කෙසේද? මේ පිළිබඳ වාර්තා කරනා ජාත්‍යන්තර හා ඔස්ට්‍රේලියානු පුවත් වාර්තාවන්හි ඇය පිළිබඳව සඳහන් වී ඇත්තේ "දරුවන්ගේ මව" නැතිනම් "මව" වැනි යෙදුමක් ඔස්සේ බවද මෙහිදී සඳහන් කළ යුතු වේ. "සුදු සම සහිත කාන්තාවක්" වැනි යෙදුම් ඔස්සේ, සමේ වර්ණය පදනම් කරගත් කොන් කිරීම් සහිත ආකල්පයන් ප්‍රවර්ධනය නොවන්නේ ද?

2) එසේම, "රූමත්" යනුවෙන් සඳහන් කරමින් එම කාන්තාවගේ බාහිර පෙනුම දැක්වීම්, පුවතට අදාළ වන්නේ කෙසේද? අදාළ නොවේ නම්, එය ස්ත්‍රී පුරුෂ භාවය පදනම් කරගත් ඒකාකෘතික කිරීමක් (Stereotyping) නොවේද?

මෙම පුවත පළ කළ ජාත්‍යන්තර හා ඔස්ට්‍රේලියානු පුවත් වාර්තාවන් මෙතැනින්:
https://www.news.com.au/.../aa7aa28db957864b1d5598fda032dbab
https://www.dailymail.co.uk/.../Huntingdale-tragedy...
https://www.perthnow.com.au/.../huntingdale-tragedy...
https://www.smh.com.au/.../sorry-for-not-being-able-to...

**#MediaEthicsSL #lka #Sinhalanews #Divaina #Aruna**